# ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

# පුරප්පාඩු

## ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ

## ඉංජිනේරු සේවා නිලධාරී (JM - 1- 1 -2016)

**බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උසස් පෙළ විභාගයේදී ගණිත අංශයෙන් සමත්ව විද්‍යාවේදී (BSC.Eng) උපාධිය හා එම අධ්‍යාපන සුදුසුකම් ලැබීමෙන් පසු රජයේ / රජයේ ආයතනයක හෝ පිළිගත් වාණිජ්‍යය ආයතනයක වර්ෂ 01 කට නොඅඩු පළපුරුද්ද ලබා තිබීම **හෝ**

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ යාන්ත්‍රික වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) හත්වැනි (07) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ අවුරුදු 03 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම. (උසස් පෙළ විභාගයේදී ගණිත අංශයෙන් සමත්ව) **හෝ**

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ යාන්ත්‍රික වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) හයවැනි (06) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ රජයේ, රාජ්‍ය, සංස්ථාවක, මණ්ඩලයක ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 05 ක පළපුරුද්දක් ලබා තිබීම. (උසස් පෙළ විභාගයේදී ගණිත අංශයෙන් සමත්ව)

## නිෂ්පාදන නිලධාරී (JM-1-1-2016)

**බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් විද්‍යාවේදී උපාධිය (අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ ගණිත අංශයෙන් හෝ විද්‍යා අංශයෙන් හදාරා තිබීම) එම අධ්‍යාපන සුදුසුකම් ලැබීමෙන් පසු රජයේ /රජයේ ආයතනයක හෝ පිළිගත් වාණිජ්‍ය ආයතනයක වර්ෂ 01 කට නොඅඩු පළපුරුද්ද ලබා තිබීම **හෝ**

ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව මොරටුව විශ්වවිද්‍යාලය (NDT), ඉංජිනේරු තාක්ෂණ ආයතනය (කටුනායක) NET, උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (HNDT) ආයතනයකින් හෝ ලබාගත් ඉංජිනේරු ඩිප්ලෝමා සහතිකය හා අවුරුදු 03 කට නොඅඩු පිළිගත් නිෂ්පාදන ආයතනයකින් පළපුරුද්ද ලබා තිබීම.

**පොදු**

**ආරම්භක වැටුප් පරිමාණය :** 2016.01.01.දින සිට JM1-1 -2016 Grade 11 - රු. 42,600 /= මිට අමතරව රජයේ අනුමත දීමනාද ගෙවනු ලැබේ. **(2025 අප්‍රේල් මස සිට නව අයවැය අනුව වැටුප් සංශෝධනය කරනු ඇත.)**

**වයස :** වයස අවුරුදු 22 ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය.

## වැද්දුම්කරු (Fitter) – (PL–2)

**(අ) අධ්‍යාපන සුදුසුකම් - (බාහිර අයදුම්කරුවන්)**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී, යටත් පිරිසෙයින් විෂයන් දෙකක්වත් සමත් වී තිබිය යුතුය. **සහ**

**(ආ) ශිල්පීය නිපුණතා /ප්‍රවීණතා**

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන්හි (N.V.Q) දෙවෙනි හෝ තුන්වැනි මට්ටමට ගැළපෙන පරිදි ඉහත තනතුර සඳහා වූ ශිල්පීය නිපුණතා/ ප්‍රවීණතා සහතිකය සමග වසර 2 කට නොඅඩු කර්මාන්ත අංශයේ පුහුණුව පළපුරුද්ද ලබා තිබිය යුතුය.

**ආරම්භක වැටුප් පරිමාණය :** 2016.01.01 දින සිට PL2-2016-Grade III රු 25,750 /= මිට අමතරව රජයේ අනුමත දීමනාද ගෙවනු ලැබේ. **(2025 අප්‍රේල් මස සිට නව අයවැය අනුව වැටුප් සංශෝධනය කරනු ඇත.)**

**වයස :** වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩ විය අය යුතුය.

**වෙනත් :** සෑම අයදුම්කරුවෙකුම

i. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

iv. සේවකයා විසින් සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය 10%ක් දැරිය යුතු අතර, සමාගම විසින් ඒ සඳහා 15%ක් දරනු ලැබේ. සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලට 3%ක දායකත්වයක් ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම මගින් දරනු ලැබේ.

v. රාත්‍රී වැඩමුර ක්‍රියාත්මක වේ.

අයදුම්පත් තමා විසින්ම සකස් කොට සියලු තොරතුරු හා සුදුසුකම් ඇතුළත් කර කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුරේ නම පැහැදිලිව සඳහන් කර අදාළ අයදුම්පත් 2025.03.14 වන දිනට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

**ලිපිනය :** **ජ්‍යෙෂ්ඨ කළමනාකරු, (මානව සම්පත් හා නීති)**
**ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්,**
**තැ.පෙ, 17, කපුවත්ත, ජා-ඇල.**